# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 පෙබරවාරි මස 05 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්විම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

" අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක 02 හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 17, රීති අංක 57 (1), 57 (3) හා 57 (5) හි සඳහන් විධිවිධානයන්ගේ කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කල යුතුය. "

## X. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

"*බස්නාහිර පළාත් සභාවේ 2012 අංක ............... දරණ පෙර පාසැල් ප්‍රඥප්තිය*"

**(දෙවන වර කියවීම)**

2013.01.22 දින සභා රැස්වීමේ, ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ වැඩ කටයුතු හා සම්බන්ධිතයි..

**02. ගරු සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප)**

**යෝජනාව :**

"***2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ රීතීන්***"

**සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම**

"බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන්,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1771/23 දරණ හා 2012 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා දාතමින් යුතු ගැසට් පත්‍රය (අතිවිශේෂ - IV (අ) වැනි කොටස - පළාත් සභා) මඟින් ප්‍රකාශයට පත් කරන ලද්දාවූද,

2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ 21(3) වන උප වගන්තියට අනුකූලව, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා 2012.10.23 වන දින ඉදිරිපත් කරන ලද්දාවූද,

" ***2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ රීති*** " නමවූ රීතීන්, පිළිබඳව විස්තරාත්මකව සළකා බැලීම සඳහා එදින එනම් 2012.10.23 දින පළාත් සභා රැස්වීමේදී ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනු ලදුව, ලද නිර්දේශයන් සමඟද සසඳා බලා, යථෝක්ත රීතීන් අනුමත කළ යුතුය. "

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු එම්.එම්.එම් අම්ජාඩ් මන්ත්‍රීතුමා :

" අද පළාත් පාලන ආයතන සතු මාර්ගයන්හි විශාල සංවර්ධනයක් සිදු වෙමින් පවතී. " මඟ නැඟුම ", " ගම නැඟුම ", " පළාත් නිශ්චිත සංවර්ධන " ආදී වශයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනයක් සිදුවේ.

නමුත්, අද පළාත් පාලන ආයතන, මාර්ග අලුත් වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අවම මට්ටමකට පත්වී ඇත. යම් යම් මාර්ග නඩත්තු කටයුතු සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම මත එම මාර්ගයන් ඛාදනයට ලක්ව දැඩි අබලන් තත්වයට පත්වී ඇති අවස්ථා අප විසින් දැක ඇත.

එම නිසා සෑම පළාත් පාලන ආයතනයකම මාර්ගයන්හි දෛනික නඩත්තු කටයුතු ඒකක ස්ථාපිත කර එම මාර්ග අවම මුදලක් වියදම් කර ආරක්ෂා කර ගැනීමටත් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාවය ඇගයීම් කිරීමටත් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අධීක්ෂණ ඒකකයක් ඇති කල යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/v(01)12/15)

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.01.23 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.